සැ. යු. - (i) 2015.02.20 වැනි දින පළ වූ අංක 1903 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV (අ) කොටස් පළ නොවීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,904 - 2015 පෙබරවාරි මස 27 වැනි සිකුරාදා - 2015.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව
ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය	—
ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ...	—
අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ...	86
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය	—
අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය	—
වෙනත් පත්කිරීම් ආදිය	86
රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය	—
රජයේ නිවේදන	87
මිල පාලන දැන්වීම්	—
ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්	—
ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන	—
ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා	—
විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්	89
නැවියන්ට දැන්වීම්	—
සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම්	—

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මාර්තු මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මාර්තු මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

85 – B 080923—302 (2015/02)
A 1-

අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 61

අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ප්‍රකාරව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I පන්තියේ එන්. කේ. ඒ. රූපසිංහ මහතා 2014 ජූනි මස 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්,

02-775

වෙනත් පත්කිරීම් ආදිය

2015 අංක 62

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දින සිට කපිතාන් නිලයේ ස්ථිර කිරීම අනුමත කර තිබේ.

1. ලුතිනන් (තාවකාලික කපිතාන්) හර්ෂ ධනංජය පාදුක්ක, යාපාරෙ (නි/66085) - 2013.01.30
2. ලුතිනන් (තාවකාලික කපිතාන්) විල්ආරච්චිගේ දොන් නිරෝෂාන් ප්‍රියංග විජේසිංහ ගුණතිලක, ශ්‍රීලංසිරෙ (නි/65819) - 2013.04.05
3. ලුතිනන් (තාවකාලික කපිතාන්) රත්නායක මුදියන්සේලාගේ සුරංජිව වීරනාත් රත්නායක, ශ්‍රීලංසිරෙ (නි/65811) - 2013.05.25

ආර්. එම්. ඩී. රත්නායක, ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ.

02-776/1

2015 අංක 63

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දින සිට කපිතාන් (උපකරණ පාලක) නිලයේ ස්ථිර කිරීම අනුමත කර තිබේ.

1. ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතාන් (උපකරණ පාලක) පහල රාලලාගේ ධනසිරි ප්‍රේමරත්න, යූඑස්පී ශ්‍රීලංසිරෙ (නි/65882) - 2013.04.29
2. ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතාන් (උපකරණ පාලක) පල්කුඹුරේ ජයසිංහ හේනලාගේ සරත් සේනාධීර, ආර්එස්පී, ශ්‍රීලකාහ (නි/66208) - 2013.06.16
3. ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතාන් (උපකරණ පාලක) බාලසූරියගේ ප්‍රේමලාල් රත්නසිරි, යූඑස්පී ශ්‍රීලයුවෙබ (නි/65692) - 2013.09.30
4. ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතාන් (උපකරණ පාලක) දංගල්ල දේවගේ සරත් ධර්මසේන, යූඑස්පී ඉසේබ (නි/66212) - 2013.10.10
5. ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතාන් (උපකරණ පාලක) ගාල්ලගේ මර්වින් ජෝසප් පීරිස්, ශ්‍රීලයුපොදුසේබ (නි/62668) - 2013.10.19
6. ලුතිනන් (උපකරණ පාලක) (තාවකාලික කපිතාන් (උපකරණ පාලක) හොරතල් පේඩිගේ ලයනල් ජයසේකර, විපාරෙ (නි/63782) - 2013.10.23

ආර්. එම්. ඩී. රත්නායක, ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ.

02-776/2

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල පහත හෙළීම

පහත නම් සඳහන් නිලධාරින් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දින සිට ඔවුන්ගේ ස්ථිර නිලය වන ලුතිනන් නිලයට පහත හෙළීම අනුමත කර තිබේ.

1. ලුතිනන් (තාවකාලික කපිතන්) ඉන්දික රුවන් කැලුම් කුමාර සිවනෙත්ති, ශ්‍රීලපාහ (නි/65539) - 2013.02.21
2. ලුතිනන් (තාවකාලික කපිතන්) බස්නායක මන්ත්‍රීරත්නලාගේ නිමල් කරුණාරත්න, ශ්‍රීලංසිරෙ (නි/65971) - 2013.10.02

ආර්. එම්. ඩී. රත්නායක, ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ.

02-776/3

රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/69/2014/පිටු/සැ.

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව/තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.02.27 වැනි දින සිට 2015.03.13 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.03.20 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

උපලේඛනය

ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර	*ඉඩම්වල විස්තර*	*ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර*
කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, ඒ දරන කොට්ඨාසයේ 318 වෙළුමේ 279 පත් ඉරුව	බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොල්ලුපිටිය, පෙන්ඩනීස් මාවතේ පිහිටි ලොට් ඒ දරන කැබැල්ලට ජේ. ආර්. ඒ. රොද්‍රිගු මානක නැන විසින් 1947.04.15 දින මැන සාදන ලද අංක 3985 දරන පිඹුරට ප්‍රකාර මායිම්, *උතුර :* සී. ජී. ස්වොක්මන්ට අයත් දේපළ *නැගෙනහිර :* වරිපනම් අංක 21 *දකුණ :* කරත්ත පාර හඳුන්වන පෙන්ඩිනීස් මාවත *බටහිර :* ලොට් 11 *ප්‍රමාණය :* අ. 00, රූ. 01, පර්. 10	01. එස්. ආර්. අමරසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1949.05.25 දින අංක 3873 දරන බෙදුම් ඔප්පුව 02. ආර්. ජයරත්නම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1977.05.27 දින අංක 622 දරන විකිණීමට එකඟ වීමේ ගිවිසුම

උපලේඛනය (සම්බන්ධිතයි)

ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර	*ඉඩම්වල විස්තර*	*ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර*
කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, ඒ දරන කොට්ඨාසයේ 579 වෙළුමේ 26 පත් ඉරුව	බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ අබ්දුල් කපූර් මාවතේ පිහිටි වරිපනම් අංක 19 දරන ලොට් ඒ2 දරන කැබැල්ලට ඩී. එස්. හෙට්ටිගේ මානක තැන විසින් 1977.06.26 දින මැන සාදන ලද අංක 478 දරන පිඹුරට ප්‍රකාර මායිම්, *උතුර* : ලොට් ඒ1 *නැගෙනහිර* : ලොට් ඒ3 *දකුණ* : අබ්දුල් කපූර් මාවත, *බටහිර* : අබ්දුල් කපූර් මාවතේ වරි. අංක 17 *ප්‍රමාණය* : අ. 00, රූ. 00, පර්. 26.34	ආර්. ජයරත්නම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1977.06.29 දින අංක 628 දරන විකුණුම් ඔප්පුව.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

02-640

ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2002 අංක 17 දරන මැනුම් පනතේ 47(1)(ඈ) වන වගන්තිය යටතේ වාර්ෂික මැනුම් බලපත්‍රය අත්හිටුවන ලද මිනින්දෝරුවරුන්ගේ නාම ලේඛනය

	ලියාපදිංචි අංකය	*සම්පූර්ණ නම*	*අත්හිටුවන ලද/අවලංගු කරන ලද කාලය*
1.	19650105	දොන් ඩේවිඩ් ක්ලැරන්ස් හීන්දෙනිය	2015.01.01 සිට 2015.06.30 දක්වා වාර්ෂික මැනුම් බලපත්‍රය අත්හිටුවන ලදී

පී. එම්. පී. උදයකාන්ත,
සභාපති,
ඉඩම් මැනුම් සභාව.

2015ක් වූ පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

02-799

ඉඩම් අමාත්‍යාංශය

2002 අංක 17 දරන මැනුම් පනත

27 වන වගන්තියේ විධිවිධාන යටතේ ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කිරීම

2002 අංක 17 දරන මැනුම් පනතේ 27(ආ)(i) හා (ii) වගන්ති යටතේ ඉඩම් අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, පහත සඳහන් තැනැත්තන් ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් ලෙස, පහත දැක්වෙන කාල පරිච්ඡේදයන් සඳහා පත් කරමි.

(ආ) මැනුම් පනතේ 27(ආ)(i) වගන්තිය යටතේ පත්කළ සාමාජිකයින් ඃ

(i)	දොන් ඩේවිඩ් යාපා අබේවර්ධන	- 2015.01.01 දින සිට 2017.12.31 දක්වා
(ii)	චන්ද්‍රවිමල ද සොයිසා ගුණතිලක	- 2015.01.01 දින සිට 2017.12.31 දක්වා
(iii)	මුහන්දිරම් කලුතන්ත්‍රි	- 2015.01.01 දින සිට 2017.12.31 දක්වා

(ඇ) මැනුම් පනතේ 27(ආ)(ii) වගන්තිය යටතේ පත්කල සාමාජිකයින් ඃ

(i)	කන්දෙ රාල්ලාගේ මහින්ද උපතිස්ස බණ්ඩාර	2015.01.01 දින සිට 2017.12.31 දක්වා

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2015ක් වූ පෙබරවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

02-800

නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය

1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම 13A(d) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල, කළුබෝවිල, ශ්‍රී මහා විහාර පාරේ අංක 62/1 දරන ස්ථානයේ පදිංචිකරු වන ජයසිංහ ආරච්චිගේ ධම්‍යා දමයන්ති යන අය විසින් උක්ත නීතිය යටතේ එකී නිවස මිලදී ගැනීමට එකල සිට ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත අයදුම්පත්‍රයක් යොමුකර තිබුණ ද, එම පරීක්ෂණය අවසන් කර නොමැති බැවින්, එම අයදුම්පත්‍රය පිළිබඳව අවසාන තීරණයක් ගැනීමට ජාතික නිවාස කොමසාරිස්වරයා ලෙස මම තීරණය කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් ඇත්නම් මෙම නිවේදනය පළකළ දින සිට මාස 3ක් ඇතුළත එකී විරෝධතාවයන් මා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු බව මෙයින් දැනුම් දෙමි.

නීතිඥ රාජා ගුණරත්න,
ජාතික නිවාස කොමසාරිස්.

නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය,
2 වැනි මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

02-837

විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 ඔක්තෝබර් මස 31 දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

ඩීඑෆ්සීසී වර්ධන බැංකුව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව නමට මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ගයාත්‍රි විසින් ලියා සහතික කරන ලද අංක 140 හා 2011 නොවැම්බර් මස 16 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම්, කාත්තන්කුඩියේ මොහොමඩ් සලීම් මොහොමඩ් ශිල්මි සහ කච්චි මොහොමඩ් මොහොමඩ් සලීම් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2014 සැප්තැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 140 දරන උකස් බැඳුම්කරය මත එකී මොහොමඩ් සලීම් මොහොමඩ් ශිල්මි සහ කච්චි මොහොමඩ් මොහොමඩ් සලීම් යන අයගෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් තිස්තුන් ලක්ෂ හැත්තෑහත් දහස් තුන්සිය අනූපහකුත් ශත හතක (රු. 33,77,395.07) මුදලක් සහ 2014 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස්තුන් ලක්ෂ හැත්තෑහත් දහස් තුන්සිය අනූපහකුත් ශත හතක් (රු. 33,77,395.07) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තිස්තුන් ලක්ෂ හැත්තෑහත් දහස් තුන්සිය අනූපහකුත් ශත හතක (රු. 33,77,395.07) මුදලක් සහ 2014 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස්තුන් ලක්ෂ හැත්තෑහත් දහස් තුන්සිය අනූපහකුත් ශත හතක් (රු. 33,77,395.07) සඳහා වර්ෂයකට

සියයට විසිහතර (24%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී අංක 140 දරන උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 140 දරන උකස් බැඳුම්කරය මගින් එකී කච්චි මොහොමඩ් මොහොමඩ් සලීම් යන අය විසින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය හා එහි පිහිටි ගොඩනැගිලි කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 140 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මාන්මුනෙයි පත්තුවේ, කාත්තන්කුඩි ග්‍රාමයේ පිහිටි "වෙම්බු පූමි" නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ බස්නාහිර පැත්තේ දෙකෙන් පංගුව වන ඉඩමට මායිම්, උතුරට : පාර ද, දකුණට සහ නැගෙනහිරට : එම්. ජෙයිනුලප්ඩීන්ට සහ බිරිඳට අයිති මෙම ඉඩමේ ඉතිරි ඉඩම් ප්‍රමාණය ද, බස්නාහිරට : වෙයියතුම්මාගේ ඉඩම ද යන මායිම් ඇතුළත පිහිටි ඉඩමට මායිම් උතුරේ සිට දකුණට බඹ නවයකුත් (09) අඩි දෙකයි (02) අඟල් හයක් (06) ද, නැගෙනහිර සිට බස්නාහිරට බඹ හයකුත් (06) අඩි එකයි (01) අඟල් දහයක් (10) ද වූ ඉඩම සහ එහි පිහිටි ගෙය හා ළිඳ වේ.

මෑතක දී කළ මැනීමකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කාත්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ, කාත්තන්කුඩි නගර සභා සීමාව ඇතුළත, අංක 06 නගර සභා කොට්ඨාසයේ, "බවුන්ඩරි ලේන් " හි පිහිටි වරිපනම් අංක 58 දරන "වෙම්බුපූමි" නමැති ඉඩමේ බලයලත් මානක ඒ. සිංගරාජා මැන සකස් කරන ලද අංක AS/11/kat/182A හා 2011.08.14 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 ලකුණු කළ බිම් කට්ටිය වූ උතුරට : රාසා අලිම් පාර ද, නැගෙනහිරට : පටුමඟ ද, දකුණට : සෙයිනුලාබ්දීන්ගේ සහ බිරිඳගේ ඉඩම ද, බස්නාහිරට : එම්. අයි. සෙයියතුම්මාගේ ඉඩම ද යන මායිම් ඇතුළත හෙක්ටෙයාර් 0.0190ක් නොහොත් පර්චස් හතකුත් දශම පහයි එකක් (අ. 0, රූ. 0, පර්. 7.51) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ස්ථිර ගොඩනැගිල්ල, ළිඳ හා ඊට අනුබද්ධ සියලු අයිතිවාසිකම් ද වේ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

02-801

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 ඔක්තෝබර් මස 31 දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව නමට වවුනියාවේ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඇන්ටන් පුනිතනායගම් ලියා සහතික කරන ලද අංක 1953 හා 2012 ජනවාරි මස 30 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම්, වවුනියාවේ, බාලසුන්තරම් චන්තිරකුමාර් සහ චන්තිරකුමාර් මීනාදේවී යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2014 ජූලි මස 31 වැනි දිනට එකී බාලසුන්තරම් චන්තිරකුමාර් සහ චන්තිරකුමාර් මීනාදේවී යන අයගෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් අසූදෙලක්ෂ අසූඅට දහස් හයසිය අසූඅටකුත් ශත තිහක (රු. 82,88,688.30) මුදලක් සහ 2014 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැත්තෑ ලක්ෂ පනස්එක් දහස් නවසිය හැත්තෑනවයකුත් ශත හැත්තෑ පහක (රු. 70,51,979.75) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන, බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට පහකුත් දශම පහක් (5.5%) ඉහල අනුපාතිකයක් වන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් අසූදෙලක්ෂ අසූඅට දහස් හයසිය අසූඅටකුත් ශත තිහක (රු. 82,88,688.30) මුදලක් සහ 2014 අගෝස්තු 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැත්තෑ ලක්ෂ පනස්එක් දහස් නවසිය හැත්තෑනවයකුත් ශත හැත්තෑ පහක (රු. 70,51,979.75) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන, බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට පහකුත් දශම පහක් (5.5) ඉහල අනුපාතිකයක් වන වාර්ෂික අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1953 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 1953 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

උතුරු පළාතේ, වවුනියා දිස්ත්‍රික්කයේ, දකුණු වවුනියාවේ, දකුණු තිලක්කමුලෙයි, වයිරවර්පුලියන්කුලම්හි පිහිටි බෙදා වෙන් කළ බිම් කොටස වූ බලයලත් මානක කේ. කරුණයිවෙල් විසින් මැන සකස් කළ අංක 0403 හා 2004.01.31 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස නිරූපිත හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හතරයි අටයි එකක් (හෙ. 0.0481) නොහොත් පර්චස් දහනවයකුත් දශම බිංදුවයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 19.02) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටසට, මායිම් උතුරට : වයිරවර්කෝවිල් වීදියේ 10 වන පටුමඟ ද, නැගෙනහිරට : ඉහත සඳහන් පිඹුරේ ලොට් අංක 2 ද, දකුණට : ජී. ශ්‍රී ස්කන්දරාජාට අයිති වයිරවර්පුලියන්කුලම් වීදිය, කුරුමන්කාඩු, අංක 194ඒ පරිශ්‍රය ද, බස්නාහිරට : වයිරවර්කෝවිල් වීදියෙන් හැරී යන 10 වන පටුමග අංක 27 පරිශ්‍රය සහ උමාසරන්ගේ භාර්යා දමයන්තිගේ දේපළ ද යන මායිම් ඇතුළත පිහිටි සම්පූර්ණ දේපළ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරි.

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

02-802

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාවයි

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2014ක් වූ අප්‍රේල් මස 21 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් සහ ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

"නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී මීට පෙර නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් (බැංකුව) නමින් ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. යූ. රනෝජිනී (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2006.01.05 වැනි දින අංක 226 සහ වර්ෂ 2006.04.27 වැනි දින අංක 303 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ගාල්ල දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ නිසි පරිදි ලියාපදිංචි කරන ලද සමාගමක් වන උපුලි ඔෆ්සෙට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද, තවද වර්ෂ 2014ක් වූ මාර්තු මස 31 වැනි දිනට එකී බැඳුම්කර යටතේ බැංකුවට රුපියල් තිස් එක් ලක්ෂ දාහතරදහස් දෙසිය හතලිස් තුනයි ශත අට (රු. 31,14,243.08) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද,

සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් තිස්එක් ලක්ෂ දාහතරදහස් දෙසිය හතලිස් තුනයි ශත අට (රු. 31,14,243.08) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2014ක් වූ අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී අංක 226 දරන බැඳුම්කරය යටතේ රුපියල් දහතුන් ලක්ෂ අසූ දහස (රු. 13,80,000) ක මුදලක් මත වසරකට සියයට පහළොවයි දශම නවය (15.9%) ක පොළිය ද සහ එකී අංක 303 දරන බැඳුම්කරය යටතේ රුපියල් හය ලක්ෂ පනස් හයදහස් හයසිය පනස් හත (රු. 6,56,657.00) ක මුදලක් මත වසරකට සියයට දාසය (16%) ක පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 13 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කර මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන චංචල දේපළ බලයලත් වෙන්දේසිකරු වූ පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ ඉඩමේ සහ පරිශ්‍රයේ දැනට සහ මින්මතුවට ස්ථිරවම සවි වී හෝ සවිකර හෝ සම්බන්ධ කර ඇති සෑම සහ සියලුම චංචල යන්ත්‍රසූත්‍ර උපකරණ ඇමුණුම්ද ඇතුලුව එයට පමණක් සීමා නොවී පහත දේ ද වේ.

1. රිසෝග්‍රාෆ් සුපර් ඩිජිටල් ඩුප්ලිකේටරය/ප්‍රින්ටරය - වර්ගය : MZ 770 විත් ස්ටැන්ඩ් වු කලර්
2. නොකිකා මිනොල්ටා Bizhub වර්ණ ඡායා පිටපත් යන්ත්‍රය/ස්කැනරය - වර්ගය : සී 250
3. හයිටෙක් - ඩෙටා ප්‍රොසෙසින් ග්‍රෆික් ආර්ට් කම්පියුටර් අවුට් පුට් ඩිවයිස් යන්ත්‍රය - FT R 5055 ඔන්ලයින් (කට්නා)
4. ඕෆ්සෙට් ස්පීඩ් මාස්ටර් ටු කලර් වර්ණ ඡායා පිටපත් යන්ත්‍ර 1යි
5. අංග සම්පූර්ණ බයින්ඩින් යන්ත්‍ර 1යි - KFW V ණය යෝජනා ක්‍රමය යටතේ

උකස් කර ඇති ඉහත සඳහන් චංචල දේපළ දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල සීමාව තුළ ගාල්ල, වදුරඹ ඩී. සැම්සන් රාජපක්ෂ මාවත අංක 28, දරන ස්ථානයේ පිහිටි උපුලි ඕෆ්සෙට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් පරිශ්‍රයේ ගබඩා කර හෝ තබා ඇත.

අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

02-665/1

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

කෝට්ටේ, ඇතුල්කෝට්ටේ, 6 වන පටුමගෙහි, 941/28 හි එක්ස්ප්‍රස් මාර්කටින් ඉම්පෙක්ස් නමින් හා විලාසයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන රාජගිරිය, නාවල, වලව්වත්ත, වලව්වත්ත පෙදෙසෙහි, අංක 19/1සී හි දොලඉහළ කංකානම්ගේ කුලරත්න මාර්ටින් හෙවත් දොලඉහල කංකානම්ගේ කුලරත්න මහතාට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

2014 දෙසැම්බර් මස 02 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. එච්. රණවක විසින් සහතික කරන ලද 2005.08.18 දිනැති අංක 2044 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. පී. ආර්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2008.05.05 දිනැති අංක 149 දරන උකස් බැඳුම්කරය හා 2007.10.01 දිනැති අංක 97 දරන උකස් බැඳුම්කරය අනුව 2014.11.13 දින තෙක් කාලීන ණය පහසුකම මත සහ අයිරා පහසුකම මත පිළිවෙලින් මුල් මුදල සහ හිඟහිටි පොලිය වශයෙන් රු. තුන්කෝටි එක්ලක්ෂ අසූහතර දහස් හයසිය විසිහයයි ශත හැට දෙකක (රු. 30,184,626.62) මුදල සහ රුපියල් දෙකෝටි විසිපන්ලක්ෂ හතලිස් දෙදහස් තුන්සිය හැත්තෑ තුනයි ශත හතලිස් හතරක (රු. 22,542,373.44) මුදල සමග කාලීන ණය රුපියල් එක්කෝටි තිස්පන් ලක්ෂයක (රු.13,500,000.00) මුදල මත වසරකට සියයට දහතුනක් (13%) බැගින් සහ ස්ථාවර අයිරා පහසුකම වන රුපියල් එක්කෝටි විසිලක්ෂයක (රු. 12,000,000.00) මුදල මත වසරකට සියයට දහහතරක (14%) බැගින් තවදුරටත් පොලිය ද, 2014.11.14 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කෝට්ටේ, ඇතුල් කෝට්ටේ 6 වන පටුමගෙහි, අංක 941/28 හි එක්ස්ප්‍රස් මාර්කටින් ඉම්පෙක්ස් නමින් හා විලාසයෙන් ව්‍යාපාරයක් පවත්වන රාජගිරිය, නාවල, වලව්වත්ත, වලව්වත්ත පෙදෙසෙහි අංක 19/1සී හි දොලඉහල කංකානම්ගේ කුලරත්න මාර්ටින් හෙවත් දොලඉහල කංකානම්ගේ කුලරත්න මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී අංක 149, අංක 97 සහ අංක 2044 උකස් බැඳුම්කර අනුව කාලීන ණය මත අයවිය යුතු රුපියල් තුන්කෝටි එක්ලක්ෂ අසූහතර දහස් හයසිය විසි හයයි ශත හැට දෙකක (රු. 30,184,626.62) සහ ස්ථාවර අයිරාව රුපියල් දෙකෝටි විසිපන්ලක්ෂ හතලිස් දෙදහස් තුන්සිය හැත්තෑ තුනයි ශත හතලිස් හතරක (රු. 22,542,373.44) මුදල සමග 2014.11.14 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, සම්බන්ධතා කළමනාකරු (අයකර ගැනීම්-ආයතනික) හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලෙ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 520 දරන නාවල බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නාවල පිහිටි වලව්වත්ත පෙදෙසෙහි වරිපනම් අංක 19/1සී දරන හැඩවකගහවත්ත , කහටගහවත්ත හෙවත් ගොරකගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි විසින් සාදන ලද 1997 නොවැම්බර් මස 22 දිනැති අංක 601බී දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කොටසට මායිම්ව, උතුරට ලොට් 1 ද, නැගෙනහිරට : වලව්වත්ත පෙදෙසෙහි අංක 27/90 දරන පිඹුරෙහි ලොට් 1 හි ඉතිරි කොටස ද, දකුණට : පී. ගාල්ලගේගේ අංක 27/90 දරන පිඹුරෙහි ලොට් 2 ද, බස්නාහිරට : වලව්වත්ත පෙදෙස ද මායිම්ව එකී අංක 601 බී දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම පහක (අ. 0 රූ. 0 පර්. 15.5) ක බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම් කොටස ද, ඒ හා බැඳුණු සියලු දේ ද වේ.

ලොට් 2 ලෙස දක්වා ඇති එකී බිම් කැබැල්ල පහත සඳහන් ඉඩම් නැවත මැනීමකි.

එකී නාවල පිහිටි හැඩවකගහවත්ත, කහටගහවත්ත හෙවත් ගොරකගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඒ. වීරක්කොඩි විසින් සාදන ලද 1997 ජූලි මස 16 දිනැති අංක 590 දරන පිඹුරෙහි ලොට් ඒ 1 නම් ඉඩම් කොටසට මායිම්ව උතුරට : ලොට් ඒ 2 ද, නැගෙනහිරට : පී. ගාල්ලගේ ගේ අංක 27/90 දරන පිඹුරෙහි ලොට් 1 හි ඉතිරි කොටසද, දකුණට : එකී අංක 27/90 දරන පිඹුරෙහි ලොට් 2 ද, බස්නාහිරට : වලව්වත්ත පෙදෙස් ද මායිම්ව එකී අංක 590 දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම පහක (අ. 0 රූ. 0 පර්. 15.50) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩම් කොටස හා ඒ හා බැඳුණු සියලු දේ ද වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 3064/218 හි ලියාපදිංචි කර ඇත. (එකී ලොට් 2 හි වර්තමාන වරිපනම් අංකය 23 ය)

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සම්බන්ධතා නිලධාරී,
අයකර ගැනීම් (ආයතනික)

ලංකා බැංකුව,
අයකර ගැනීම් (ආයතනික) ඒකකය,
"ලංකා බැංකු චතුරශ්‍රය",
අංක 1, ලංකා බැංකු මාවත,
කොළඹ 01
2015.01.21

02-797

ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 දෙසැම්බර් මස 17 වැනි දින දී මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ත්‍රිකුණාමලය ප්‍රසිද්ධ නොතාරිස් ටී. තුශ්‍යාන්තන් විසින් ලියා සහතික කරන ලද අංක 1369 හා 2011 දෙසැම්බර් මස 07 වැනි දින සහ අංක 1583 හා 2012 මැයි මස 18 වැනි දින දරන උකස් බැඳුම්කර දෙක මත අයවිය යුතු මුදල් ගෙවීම් ත්‍රිකුණාමලය කින්නියාවේ අබ්දුල් හමීදු මුහම්මදු ෆායිස් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2014 සැප්තැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 1369 හා 1583 දරන උකස් බැඳුම්කර දෙක මත එකී අබ්දුල් හමීදු මුහම්මදු ෆායිස් යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් පනස්ලක්ෂ තිස්දහස් හතළිස්

තුනකුත් ශත හතළිස් අටක (රු. 50,30,043/48) මුදලක් සහ 2014 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහහතර ලක්ෂ පනස් අට දහස් තුන්සිය විසි පහක් (රු 14,58,325) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින් එනම්,

(අ) එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝම්බර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකය (ඒඩබ්ලිව්පීආර්) හෝ,

(ආ) එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකය,

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට අටක (8%) ආන්තිකයක් එකතු කර ගණනය කළ වාර්ෂික අනුපාතිකය මත පොළිය ද රුපියල් තිස්තුන් ලක්ෂ හතළිස් හත්දහස් හයසිය හැත්තෑතුනකුත් ශත හැත්තෑ හතක (රු. 33,47,673.77) මුදලක් සඳහා එක් එක් මාසයේ ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට අටකුත් දශම පහක (8.5%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත ගණනය කර ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල රුපියල් පනස් ලක්ෂ තිස්දහස් හතළිස් තුනකුත් ශත හතළිස් අටක (රු. 50,30,043.48) මුදලක් සහ 2014 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහහතර ලක්ෂ පනස්අට දහස් තුන්සිය විසි පහක් (රු. 14,58,325) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින් එනම්,

(අ) එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකය (ඒඩබ්ලිව්පීආර්) හෝ ;

(ආ) එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝම්බර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකය ;

යන මෙයින් ප්‍රතිශෝධනය දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට අටක (8%) ආන්තිකයක් එකතු කර ගණනය කළ වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, රුපියල් තිස්තුන් ලක්ෂ හතළිස් හත්දහස් හයසිය හැත්තෑතුනකුත් ශත හැත්තෑ හතක (රු. 33, 47,673.77) මුදලක් සඳහා එක් එක් මාසයේ ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට අටකුත් දශම පහක (8.5%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත ගණනය කර ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනයට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක්, මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ ගොඩනැගිලි හා එහි පිහිටි වෙනත් සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී අංක 1369 හා 1583 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1369 සහ 1583 දරන උකස් බැඳුම්කර මගින් එකී අබ්දුල් හමීදු මුහම්මදු ෆායිස් යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි සංශෝධිත පරිදි වූ 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 1369 හා 1583 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කින්නියා නගර සභා බලප්‍රදේශය ඇතුළත, අංක 1 සින්න කින්නියා නගර සභා කොට්ඨාසයේ පිහිටි කින්නියා 01 මඩකලපුව පාර වරිපනම් අංක 27 දරන ත්‍රිකුණාමලයේ බලයලත් මානක ආර්. බාලේන්ද්‍රන් විසින් සකස් කරන ලද අංක 1342 හා 2008.08.01 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස නිරූපිත "කින්නියා තෝට්ටම්" නමැති ඉඩමෙන් බෙදා වෙන්කළ බිම් කොටස වන උතුරට : එම්. එස්. උවයිස් හිමිකම් කියන දේපළ ද, නැගෙනහිරට : රජයේ ඉඩම ද, දකුණට : එම්. එස්. උවයිස් හිමිකම් කියන දේපළ ද, බස්නාහිරට : මඩකලපුව පාර ද, යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් දහහතරකුත් දශම එකයි එකක් (අ. 0, රූ. 1, පර්. 14.11) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ.

ඉහත සඳහන් ඉඩම නැවත මනින ලදුව, මෙම බැඳුම්කරය මගින් උකස්කරනු ලබන බිම් කොටස, බලයලත් මානක එම්. ඒ. මොහොමඩ් අන්වර් විසින් නැවත මැන සකස් කළ අංක 633 හා 2011.11.20 දින දරන පිඹුරෙහි ලොට් ඒ ලෙස ලකුණු කර නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කින්නියා නගර සභා බල ප්‍රදේශය ඇතුළත, අංක 1 සින්න කින්නියා නගර සභා කොට්ඨාසයේ පිහිටි කින්නියා 01 මඩකලපුව පාර වරිපනම් අංක 27 දරන උතුරට : එම්. එස්. උවයිස් හිමිකම් කියන දේපළ ද, නැගෙනහිරට : ත්‍රිකුණාමලයේ බලයලත් මානක ආර්. බාලේන්ද්‍රන් විසින් මැන සකස් කරන ලද අංක 1342 හා 2008.08.01 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 හි ඉතිරි කොටස ද, දකුණට : එම්. එස්. උවයිස් හිමිකම් කියන දේපළ ද, බස්නාහිරට : මඩකලපුව පාර ද, යන මායිම් ඇතුළත පිහිටි රූඩ් එකක් (අ. 0, රූ. 01, පර්.0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම ලෙස නිරූපණය කර තිබේ. මෙයට මෙම බිම් කොටසට අනුබද්ධ සියලු අයිතිවාසිකම් ද ඇතුළත් වේ.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5 ගාලු පාර,
කොළඹ 03

02-803

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2014ක් වූ අප්‍රේල් මස 21 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් සහ ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

"නැෂනල් ඩිවලොප්මනට් බැන්ක් පීඑල්සී මීන් පෙර නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් (බැංකුව) නමින් ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. යූ. රතෝජනි (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2006.01.05 වැනි දින අංක 224 සහ වර්ෂ 2006.04.27 වැනි දින අංක 301 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ගාල්ල දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ නිසි පරිදි ලියාපදිංචි කරන ලද සමාගමක් වන උපුලි ඔෆ්සෙට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද, තව ද පුවක්දණ්ඩාවේ ලොකුඅචාරිගේ සෝමපාල යන අය මෙහි පහත විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයෙහි නිදහස් අයිතිකරු සහ ණයට ගන්නා හි කළමණාකාර අධ්‍යක්ෂ වන අතර සහ ණයට ගන්නා කෙරෙහි මනා සහ සෑහෙන සම්බන්ධතාවයක් ඇති අතරම ඔහු විසින් සිය නිදහස් අයිතිවාසිකම් සහ බලපුළුවන්කාරකම් එකී බැඳුම්කර මගින් බැංකුවට උකස් කර ඇති හෙයින් ද, තව ද වර්ෂ 2014ක් වූ මාර්තු මස 31 වැනි දිනට එකී බැඳුම්කර යටතේ බැංකුවට රුපියල් හැටනව ලක්ෂ අනූ දෙදාහස් හාරසිය පහයි ශත අනූව (රු. 69,92,405.90) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද,

සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් හැටනව ලක්ෂ අනූ දෙදහස් හාරසිය පහයි ශත අනූව (රු. 69,92,405.90) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2014ක් වූ අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී අංක 224 දරන බැඳුම්කරය යටතේ රුපියල් විසිලක්ෂ හැත්තෑදහස (රු. 20,70,000) ක මුදලක් මත වසරකට සියයට පහළොවයි දශම නවය (15.9%) ක පොලිය ද සහ එකී අංක 301 දරන බැඳුම්කරය යටතේ රුපියල් විසිහය ලක්ෂ විසිහය දහස් හයසිය විසි අට (රු. 26,26,628) ක මුදලක් මත වසරකට සියයට දාසය (16%) ක පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද, ප්‍රධාන පනතේ 13 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්), ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කර මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය ඇතුලුව නිදහස් අයිතිවාසිකම් සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ද බලයලත් වෙන්දේසිකරු වූ පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ."

උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර, ගාල්ල මහ නගර සභා සීමාව තුළ ඇතිලිගොඩ හි පිහිටි කඳුරුගහඹිවිට නොහොත් කැබැල්ලගහඹිවිට යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ගාර්වින් ද සිල්වා විසින් මැන සාදන ලද 1984.07.10 දින අංක 2845 දරන පිඹුර පරිදි මැන බෙදා වෙන් කළ ලොට් 3A දරන ඉඩම් කොටසට මායිම්, එනම්, උතුරට : ඇල (ජල කාණුව) සහ තල්ගස්දූවේවත්ත ද, නැගෙනහිරට : තල්ගස්දූව හීන් ඇල ද, දකුණට : එම ඉඩමේම ලොට් 2, 3B සහ ලොට් 4 සහ බටහිරට : හේලී පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් දාහතයි දශම අට (අ. 0, රූ. 3, පර්. 17.8) ක ඉඩම සමඟ ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි, ගස්කොළන් ඇතුලු එයට සම්බන්ධ සෑම සහ සියලුම දේ ද සමග භූමික අයිතිය ද වේ.

බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ගාර්වින් ද සිල්වා විසින් සාදන ලද 1992.11.09 දින අංක 4181 දරන නව පිඹුර පරිදි ලොට් 3A දරන ඉඩම් කොටස, ලොට් 1, 2 සහ ලොට් 3 ලෙස අනු කොටස්වලට බෙදා වෙන් කර ඇති අතර, ඒ අනුව එම ඉඩම් කොටසට මායිම්, එනම්, උතුරට : තල්ගස්දූවේවත්ත ද, නැගෙනහිරට : තල්ගස්දූව හීන් ඇල ද, දකුණට : එම ඉඩමේම ලොට් 4, 3B සහ ලොට් 2 සහ බටහිරට : ගාල්ල බටදූව හේලී පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් ලොට් 1 දරන ඉඩම් කොටස (අ. 0, රූ. 1, පර්. 18.25) ක් ද, ලොට් 2 දරන ඉඩම් කොසට (අ. 0, රූ. 1, පර්. 22.70) ක් ද සහ ලොට් 3 දරන අඩි 15ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම් කොටස (අ. 0, රූ. 0, පර්. 16.55)ක් ද වේ.

ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ ඉඩමේ සහ පරිශ්‍රයේ දැනට සහ මින්මතුවට ස්ථිරවම සවිවී හෝ සවිකර හෝ සම්බන්ධ කර ඇති සෑම සහ සියලුම නිශ්චල යන්ත්‍රසූත්‍ර උපකරණ ඇමුණුම් ද ඇතුලුව, විදුලි සැපයීමේ පද්ධතිය සමග උපකරණ ද, ජලය සැපයීමේ පද්ධතිය සමඟ උපකරණ ද, විදුලි සංදේශ පද්ධතිය සමග උපකරණ සහ වායුසමීකරණ පද්ධතිය ද වේ.

අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

02-665/2

මහජන බැංකුව - පුත්තලම ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී දරන වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.05.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. එස්. රත්සිරිනි ජෝශප් මහත්මිය විසින් 2011.08.29 දින රු. 2,000,000 සඳහා සහතික කරන ලද අංක 360 දරන උකස්කරය ද 2011.08.29 දින රු. 2,000,000ක් සඳහා සහතික කරන ලද අංක 362 දරන උකස් කරය ද 2013.03.20 දින රු. 1,750,000ක් සඳහා සහතික කරන ලද අංක 1081 දරන උකස්කරයද යන උකස්කරයන් ප්‍රකාර ගෙවීම් මහාදේවන් දයානාත් හෙවත් මහාදේවන් දයානාස් යන අයවලුන් විසින් එකී උකස්කරයන් යටතේ දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති රුපියල් දස ලක්ෂ හැත්තෑ එක් දහස් නවසිය අනූ දෙකයි ශත අසූ එකයි (රු. 1,071,992.81) ක මුදලක්, රුපියල් විසිලක්ෂය (රු. 2,000,000) ක මුදලක් සහ රුපියල් හත්ලක්ෂ අසූ පන්දහස් විසිතුනයි

ශත විසිහය (රු. 7,85,023.26) ක මුදලක් සහ රුපියල් දස ලක්ෂ හතලිස් එක් දහස් පන්සිය දහනවයයි ශත දෙක (රු. 1,041,519.02) ක මුදලක් අයවීමට ඇති බැවින් ද, රුපියල් දස ලක්ෂ හැත්තෑ එක් දහස් නවසිය අනූ දෙකයි ශත අසූ එකයි (රු. 1,071,992.81) ක මුදල සඳහා 2014.02.03 දින සිට වර්ෂයකට 15% බැගින් ද, රුපියල් විසි ලක්ෂය (රු. 2,000,000) ක මුදල සඳහා 2013.09.01 දින සිට වර්ෂයකට 16% බැගින් ද, රුපියල් හත්ලක්ෂ අසූ පන් දහස් විසි තුනයි ශත විසිහය (රු. 7,85,023.26) ක මුදල සඳහා 2014.01.25 දින සිට 15% බැගින් ද, රුපියල් දසලක්ෂ හතලිස් එක්දහස් පන්සිය දහනවයයි ශත දෙක (රු. 1,041,519.02) ක මුදල සඳහා 2014.01.08 දින සිට වර්ෂයකට 15% බැගින් පොළිය ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් දසලක්ෂ හැත්තෑ එක් දහස් නවසිය අනූ දෙකයි ශත අසූ එකයි (රු. 1,071,992.81) ක මුදලක්, රුපියල් විසි ලක්ෂය (රු. 20,00,000) ක මුදලක් සහ රුපියල් හත්ලක්ෂ අසූ පන් දහස් විසිතුනයි ශත විසිහය (රු. 7,85,023.26) ක මුදලක් සහ, රුපියල් දසලක්ෂ හතලිස් එක්දහස් පන්සිය දහනවයයි ශත දෙක (රු. 1,041,519.02) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් එකී අංක 360 දරන උකස්කරය ද අංක 362 දරන උකස්කරය සහ 1081 දරන උකස්කරය ද යන උකස්කරත් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

I. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් පුත්තලම කඩවත් සතර තුළ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුත්තලම නගර සභා සීමාව තුළ නිල්අඩිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් පුත්තලම නගරයේ නින්දෙනිය නමැති ගමේ පිහිටි නින්දෙනිය කානි නමැති ඉඩමට ජේ. ඒ. වී. රාජනායගම් බලයලත් මානක තැන විසින් 2001.11.23 ලෙස ලියාපදිංචි වී තිබුණ ද, අදාළ පිඹුර ප්‍රකාරව 2001.03.28 වැනි දින මැන සාදන ලද අංක 1495 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 04 දරන ඉඩම් කොටසට එකී මානක තැන විසින්ම නිකුත් කරන ලද සත්‍ය පිටපත ප්‍රකාර මායිම්, උතුරට : ඉහත කී පිඹුරේ ලොට් අංක 03 දරන කොටස ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරේ ලොට් 05 දරන තිරේසාට අයිති ඉඩම ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර, බස්නාහිරට : මාර්කු යන අයට අයිති ඉඩම ද යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් අට (අ. 0, රූ. 1, පර්. 8) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A04/171හි ලියාපදිංචි වී ඇත.

II. ඉහත කී පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නිල් අඩිය ග්‍රාම නිලධාරී කොටසට අයත් පුත්තලම නගරයේ තිල්ලඩිය නමැති ගමේ පිහිටි තිල්ලඩිය කානි නමැති ඉඩමට වී. ටී. බාලසුබ්‍රමනියම් බලයලත් මානක තැන විසින් 2000.10.29 වැනි දින මැන සාදන ලද අංක 1704 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : අබූ හනීෆාට අයිති ඉඩම ද, නැගෙනහිරට : විනිෆ්‍රීඩාට අයිති ඉඩම ද, දකුණට : කේ. සෙන්තිල්මානිට අයිති ඉඩම ද, බස්නාහිරට : පාර ද යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් පර්චස් දාහතරයි දශම හය (අ. 0, රූ. 0, පර්. 14.6) ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A/puth/01/67 ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර-පුත්තලම.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

02-748

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.